# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,467 - 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 3946 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 3958 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 02 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඨ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ථ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පරිසර අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම -2025**

පරිසර අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම් :**

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද :*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම; (සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිල මුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිළිව සඳහන් කර තිබිය යුතු ය.) ;

*හෝ*

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුනකට (03) නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම. (ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානී විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය.)

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
II. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
III. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු,
IV. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
V. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

*සටහන :* මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරු ය.

(iii) *කායික යෝග්‍යතාව :*

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් :*

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්

ක්‍රමයට /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

V. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

4. **වයස් සීමාව**

අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. **වැටුප් පරිමාණය**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු: 82,150-10x2,400-8x2,940-17x3,900- රු. 195,970/- (SL-1-2025) වේ.

එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

6. **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **01.** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | **25** |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්විද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | **සටහන** I : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ. | | |
| | **සටහන** II : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

<table>
<tr><th>අනු අංකය</th><th>විෂය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද<br><br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම<br><br>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
<br>*සටහන -*<br>ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන්වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.</td><td></td><td>35</td></tr>
<tr><td>03.</td><td>භාෂා හැකියාව<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබා ගත් උපාධිය</td><td>15</td><td>15</td></tr>
<tr><td></td><td>(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br><u>කේවල</u><br><br>I. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 12<br>II. දෙවන ස්ථානය - 10<br>III. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම</u><br><br>I. ප්‍රථම ස්ථානය / හොඳම කුසලතාවය - 10<br>II. දෙවන ස්ථානය - 08<br>III. තෙවන ස්ථානය / වෙනත් කුසලතා - 06</td><td>12</td><td></td></tr>
<tr><td></td><td>(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්</td><td>10</td><td></td></tr>
</table>

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක් | 05 | |
| | *සටහන -* ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| **04** | **තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම** | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා | 10 | **10** |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තිය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක් | 08 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් | 05 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තිය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.) | 04 | |
| | *සටහන :* ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| **05** | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව**<br><br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ :<br><br>○ ශක්තීන් (Strength questions) (ලකුණු 02),<br>○ අවස්ථානුකූලව තීරණය ගැනීමේ හැකියාව (Situational questions) ( ලකුණු 03) හා<br>○ දක්ෂතාව ( Competency questions) (ලකුණු 10)<br><br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | **15** |
| | **එකතුව** | | **100** |

7. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

(i) අයදුම්පත් **2026.01.09** දිනට හෝ ඊට ප්‍රථම “ලේකම්, පරිසර අමාත්‍යාංශය, සොබාදම් පියස, අංක 416/ සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 3.4 දක්වාත්, දෙවන පිටුව 3.5 සිට 6.0 දක්වාත්, තෙවන පිටුව අංක 7.0 සිට 9.0 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ “ පරිසර අමාත්‍යාංශයේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2025” යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු, රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජාස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
පරිසර අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

පරිසර අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

( කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.
සිංහල -2 / දෙමළ - 3 / ඉංග්‍රීසි -4 )

**සටහන** - අයදුම් කරන මාධ්‍ය වෙනස් කළ නොහැක.

---

1.0 1.1 සම්පූර්ණ නම ( මයා/මිය/මෙය) :.............................................................
(සිංහලෙන්/ දෙමළෙන්) :.............................................................
උදා : GUNAWARDHANA, M.G.B.S.K

1.2 සම්පූර්ණ නම :.............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.............................................................

1.3 මුලකුරු සමග නම ( මයා/මිය/මෙය) :.............................................................
(සිංහලෙන්/ දෙමළෙන්) :.............................................................
උදා : එම්.ජී.බී.එස්.කේ.ගුණවර්ධන.

1.4 මුලකුරු සමග නම් :.............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.............................................................

2.0 2.1 ස්ථිර ලිපිනය :.............................................................
(සිංහලෙන්/ දෙමළෙන්) :.............................................................
2.2 ස්ථිර ලිපිනය :.............................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.............................................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ 0
(අදාළ කොටුව තුළ ලියන්න) ස්ත්‍රී 1

3.2 විවාහක/ අවිවාහක බව : විවාහක - 1
(අදාළ කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

3.3 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.4 2026.01.09 දිනට වයස : අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4.0 4.1 දුරකතන අංකය : ස්ථාවර

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ජංගම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 උපාධිය ආයතනය දිනය

....................................... ....................................... ...............................

....................................... ....................................... ...............................

6.0 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය : ...........................................

6.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : .........

6.2 රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය: ………..

*මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :-

7.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : ..............................................................................................
..............................................................................................

7.2 අතිරේක වෘත්තීය පළපුරුද්ද : ..............................................................................................
..............................................................................................

7.3 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : ..............................................................................................
..............................................................................................

7.4 භාෂා ප්‍රවීණතාව : ..............................................................................................
..............................................................................................

*අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු තිබේද?
(ඔව් නම් විස්තර කරන්න)

.......................................................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකුවන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

....................................... ..........................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිට දී .............................................. දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

.......................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :
තනතුර :
දිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත විස්තර සඳහන් ...................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

......................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

12 - 167

## යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම (කෙඩෙට් නිලධාරි පාඨමාලාව - උපාධි)

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරින් හට **හමුදා අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනැමේ.** ඔවුන් **දෙවන ලුතිනන්වන** ආරම්භක නිලයේ අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. <u>මූලික සුදුසුකම්</u>:

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | විවාහක/අවිවාහක බව | : | අවිවාහක. |
| ඇ. | වයස | : | 2026 මාර්තු මස 31 දිනට වයස අවුරුදු 18 ත් 23 ත් අතර විය යුතුයි. |
| ඈ. | උස | : | අඩි 5 යි අඟල් 6 ට (167.5cm) නොඅඩු විය යුතුයි. |
| ඉ. | බර | : | කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුයි. |
| ඊ. | පපුව | : | අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | : | 6/6 විය යුතුය ( උපැස් සහ කාච රහිතව). |
| ඌ. | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතුය. |

4. <u>අධ්‍යාපන සුදුසුකම්</u>:

*අ.* අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයන් 03ක් සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය "Yes" ලෙස සඳහන්ව තිබීම;

*සහ*

*ආ.* අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයන් අටක් (08) සමත්වීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම *හෝ* NVQ Level 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි භාෂාව සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතු ය).

*හෝ*

*ඇ.* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාගවලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

*ඈ.* ඉහත සුදුසුකම් සපුරා ඇති හා 2025 වර්ෂයට අදාළව අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයවළුන්ට ද මේ සඳහා අයදුම්කළ හැක.

***සැ:යු* : 2025 වර්ෂයට අදාළ අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයදුම්කරුවන් අවසාන සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට අ.පො.ස. (උ/පෙළ) අධ්‍යාපන සුදුසුකම් ඉහත සඳහන් පරිදි සපුරා තිබීම අනිවාර්යය වේ.**

5. <u>වෙනත් සුදුසුකම්</u>. : ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. <u>පොදු</u>:

*අ.* පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරින් හට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

*ආ.* මනා ශාරීරික සෞඛ්‍ය තත්වයේ සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතුයි.

7. <u>සේවා කොන්දේසි</u>:

*අ.* පුහුණු කාලසීමාව අවසානයේ සිට (අධිකාරියට පත්කරනු ලබන දිනයේ සිට) වසර 10 ක් අනිවාර්යයෙන්ම යුද්ධ හමුදා සේවයේ යෙදී සිටිය යුතුය. ඒ සඳහා යුද්ධ හමුදාව සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිස්නාවකට යටත් කරනු ලැබේ.

*ආ.* පුහුණුවීම ලබන කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකුගේ මාසික වැටුප රු:105,415.80

කි (සියලු දීමනා සහිතව). කෙඩෙට් නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුළදී ඔවුන්හට කිසිදු වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

ඈ. කෙඩෙට් නිලධාරින්හට ශ්‍රී ලංකාවේ දී මාස 33ක කාලයක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණුවීම්වල නිරත වීමට සිදුවේ.

ඈ. පුහුණුවීමේ කාලය තුළ දී කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

ඉ. <u>පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම</u>:

(1) පුහුණුවීම් කාලසීමාව තුළ දී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුනු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, තම අයහපත් ආරක්ෂක නිශ්කාෂන, තමන් විසින් වලක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරින් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුනු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

8. <u>වැටුප් හා දීමනා</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ නිලධාරින් වශයෙන් දෙවන ලුතිනන් වන ආරම්භක නිලයෙහි අධිකාරියට පත්කරනු ලැබීමේ දී, ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරින්ට අදාළවන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| අ: අ: | නිලය | කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025 ට අනුව ඒකබද්ධ වැටුප | | වැටුප් වර්ධක |
|---|---|---|---|---|
| | | 2026 රු. ශත | 2027 රු. ශත | |
| 1 | දෙවන ලුතිනන් | 60,709.00 | 65,880.00 | ස්ථිර |
| 2 | ලුතිනන් | 74.,438.00 | 82,150.00 | 30x2400 |
| 3 | කපිතන් | 86,601.00 | 96,550.00 | 24x2400 |
| 4 | මේජර් | 94,710.00 | 106,150.00 | 22x2400 |
| 5 | ලුතිනන් කර්නල් | 97,192.00 | 109,090.00 | 17x2940 |
| 6 | කර්නල් | 117,857.00 | 133,570.00 | 17x3900 |
| 7 | බ්‍රිගේඩියර් | 124,446.00 | 141,370.00 | 15x3900 |
| 8 | මේජර් ජෙනරාල් | 136,575.00 | 156,000.00 | 12x4850 |
| 9 | ලුතිනන් ජෙනරාල් | 144,770.00 | 165,700.00 | 10x4850 |
| 10 | ජෙනරාල් | 157,063.00 | 180,250.00 | 7x4850 |

9. <u>අනෙකුත් දීමනා</u>.: පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

අ. සුදුසුකම් දීමනා.

ආ. නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.

ඇ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක නිලධාරින්ට පමණක්).

ඈ. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

10. පහත සඳහන් පහසුකම්/දීමනා ගෙවනු ලැබේ:

අ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.

ආ. කුලී නිවාසයක වාසය කරන විට ගෙවල් කුලී දීමනා.

ඇ. නොමිලේ නිල ඇඳුම්.

ඈ. විවාහක නිලධාරින්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරින් අනුගාමික සේවය.

ඉ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරින්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

11. <u>වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරීන්ට බලපවත්වනු ලැබේ</u>

අ. කළමණාකරන සේවා චක්‍රලේඛ 05/2025.

ආ. යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

ඇ. 1993 අගෝස්තු මස 17 දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බල හමුදා) සේවා නියෝගය.

ඈ. 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති *විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

12. මෙහි පහත 13 ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමග ඇපබැඳුම්කරයකට අත්සන් කළ යුතුය. විශේෂ අවස්ථාවල දී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරීත්වය හිමිවනු ලැබේ.

13. <u>අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය</u>:

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි අයදුම්කරුවෙකු වන ..........ගේ පියා/මව/භාරකරු මම වෙමි.

ආ. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළ දී අයදුම්කරුහට දරන්නටවන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරිය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වලක්වාලිය හැකි හේතූන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

නොගැලපෙන වචන කපා හරින්න.

.................................
මව/පියා/භාරකරුගේ අත්සන

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන්:........................................

දිනය :..........................

සාක්ෂිකරුගේ අත්සන :..............................

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :..........................................

14. <u>භාෂා අවශ්‍යතා</u>.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුවේ.

15. <u>අනන්‍යතාවය තහවුරු කිරීම</u>.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 'රියදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

16. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අයදුම්කරු මුදවාලිය හැකි බවට

සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුයි.

17. ඉල්ලුම් පත්‍ර.

ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්කරුගේම අත් අකුරින් ලියා 2026 ජනවාරි මස 31 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ **''පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල''** යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහළ කෙලවරේ **"යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක 96 (උපාධි) පාඨමාලාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට පෙර හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk/officer වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

18. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකපත්හි ඡායා පිටපත් එවිය යුතුය:

අ. උප්පැන්න සහතිකය.

ආ. ඉදිරිපත්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.

ඇ. පාසල් හැරයාමේ සහතිකය.

ඈ. ග්‍රාම නිලධාරි සහතිකය.

ඉ. පොලිස් නිශ්කාෂන සහතිකය.

ඊ. ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

උ. අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කළහැකි අයෙකුගෙන්) පුද්ගලයින්ගෙන් මෑතක දී ලබාගන්නා ලද චරිත සහතිකයක් සහ අයදුම්කරු අවසානවරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබාගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතු වේ.

ඌ. අදාළ වෙනත් සහතික.

එ. තව ද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2"x2 1/2" ප්‍රමාණයේ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතිකකර එවිය යුතු ය.

19. සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම.

ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

20. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය **පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල** හිදී පැවැත්වීමට කටයුතු සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ආපසු ගෙවනු නොලැබේ.

21. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්ෂකයා නුසුදුස්සෙකු වනු ඇත.

22. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ**
**ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී,**
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2025 නොවැම්බර් මස 19 දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

12 - 182

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ "ආශ්‍රිත නිලධාරී" සේවා ගණයේ I, II හා III කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

සේවා ගණ :

1. සංවර්ධන සහකාර
2. සැලසුම් හා මූල්‍ය සහකාර
3. කළමනාකරණ සහකාර (උපාධි)

01. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams/ E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2025 දෙසැම්බර් මස 12 දින පෙ. ව. 9.00ට විවෘත වන අතර 2026 ජනවාරි මස 09 දින රාත්‍රී 9.00ට අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙම විභාගය **2026 මාර්තු මස කොළඹ දී** පමණක් පවත්වනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනවා ඇත.

(iii) මෙම විභාගය සඳහා අයදුම්කළ හැක්කේ මෙම අමාත්‍යාංශය යටතේ උක්ත සඳහන් සේවා ගණ යටතේ පත්වීම් ලද නිලධාරීන්ට තමන් අයත් ශ්‍රේණිය අනුව පහත වගුවේ දක්වා ඇති පරිදි වේ:-

| *අනු. අංකය* | *විභාගයේ නම* |
|---|---|
| 01. | ආශ්‍රිත නිලධාරී සේවයේ I කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා) |
| 02. | ආශ්‍රිත නිලධාරී සේවයේ II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා) |
| 03. | ආශ්‍රිත නිලධාරී සේවයේ III කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා) |

03. අයදුම්පත්:
මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව සිදු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව /භාර නොගන්නා ලද බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ප්‍රථමවරට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවක එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රුපියල් 250/- බැගින් වූ විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:-

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions) ;
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

05. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ:-

(i) ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා වෙනත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

07. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විභාග ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. අයදුම්පතේ ද විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු යි. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

10. විභාග පටිපාටිය.- එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරින් සඳහා වන විෂයයන් සහ විෂය නිර්දේශ පහත සඳහන් පරිදි වේ.

10.1 ආශ්‍රිත නිලධාරි සේවයේ වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(III ශ්‍රේණියේ නිලධාරින් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම | 01 | 100 | පැය 2 | 40 |
| 02. ගිණුම් කටයුතු | 01 | 100 | පැය 2 | 40 |

10.1.1 *කාර්යාල ක්‍රම.-* රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව හා නියෝග අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

10.1.2 *ගිණුම් කටයුතු.-* රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය.

10.2 ආශ්‍රිත නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(II ශ්‍රේණියේ නිලධාරින් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. ආයතන කාර්ය පටිපාටිය | 03 | 100 | පැය 2 | 40 |
| 02. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 04 | 100 | පැය 2 | 40 |

10.2.1 *ආයතන කාර්ය පටිපාටිය.-* ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාරය පටිපාටික රීති.

10.2.2 *මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය.-* මුදල් රෙගුලාසි සංග්‍රහය I, II, III, IV, VI පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

10.3 ආශ්‍රිත නිලධාරි සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(I ශ්‍රේණියේ නිලධාරින් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 01 | 100 | පැය 2 | 40 |
| 02. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ රෙගුලාසි හා නියමයන් | 01 | 100 | පැය 2 | 40 |

10.3.1 *සාමාන්‍ය දැනීම.-* අධ්‍යාපන සංවර්ධන පිළිබඳ සිදු වී ඇති කාලීන වෙනස්කම් සම්බන්ධයෙන් ලබා ඇති අවබෝධය.

10.3.2 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ රෙගුලාසි හා නියමයන්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ අවබෝධය.

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. මෙම විභාගය නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

**නාකල කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 02 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

12 - 169

සංශෝධනය යි

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර -තාක්ෂණ බණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

1. ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව 2025.11.14 දින පළ වූ අංක 2,463 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

   - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර -තාක්ෂණ බණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 යන්න පහත පරිදි-

     **"ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩය - 03 සේවා ගණයට අයත් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025".**

   - ඡේද අංක 8 හි සඳහන්, ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ, යන්න පහත පරිදි-

     **"ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් තාක්ෂණ සහයක III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ."**

2. එම නිවේදනයේ අනිකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 28 දින,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

12 - 188/1

සංශෝධනය යි

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

1. ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාළව 2025.11.14 දින පළ වූ අංක 2,463 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

   - ඡේද අංක 7 හි සඳහන්, ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. යන්න පහත පරිදි-

     **"ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා ලිඛිත විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ."**

2. එම නිවේදනයේ අනිකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

2025 නොවැම්බර් මස 28 දින,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

12 - 188/2

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

**2026 පළමු අර්ධ වර්ෂය (ජනවාරි කණ්ඩායම) ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තිය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන්හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා 2026 පළමු අර්ධ වර්ෂය (ජනවාරි කණ්ඩායම) ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත. එම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තිය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා, පාඨමාලා කේත අංක සහිතව පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලයද සඳහන් කර ඇත.

පාඨමාලා විස්තර දැන ගැනීම සහ පාඨමාලා සඳහා අයදුම් කිරීම :

1. පාඨමාලා පිළිබඳ වැඩි විස්තර පහත දක්වන ලද ක්ෂණික දුරකථන අංකයන්ගෙන් / දිස්ත්‍රික් දුරකථන අංකයන් මඟින් හා අපගේ Whatsapp දුරකතනය හා සම්බන්ධ වී SMS පණිවිඩ යොමු කිරීමෙන් ලබා ගත හැකිය.
2. ඔබ දිස්ත්‍රික්කයට ආසන්නතම වෘත්තිය පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය / ජාතික වෘත්තිය පුහුණු ආයතනයට හෝ ග්‍රාමීය මධ්‍යස්ථානයට ගොස් අයදුම්පත් භාර දිය හැකිය.
3. පහතින් දක්වන ලද වෙබ් පිටුවට ගොස් මාර්ගගත (Online) ක්‍රමවේදය යටතේ ද පාඨමාලා සඳහා අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2026 ජනවාරි මස 05 දින |
| වැඩි විස්තර සඳහා | - | |
| දුරකතන අංක (ක්ෂණික) | - | 011-7270270 |
| | | 011-7277888 |
| | - | 070-6767696 (Whatsapp) |
| ඊ-මේල් ලිපිනය | - | cgjp@vtasl.gov.lk |
| වෙබ් ලිපිනය | - | www.vtasl.gov.lk |
| ෆේස්බුක් පිටුව | - | www.facebook.com/vta |

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය.

4 මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

## දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා ජාතික වෘත්තිය පුහුණු ආයතන දුරකතන අංක

| දිස්ත්‍රික් මධ්‍යස්ථාන | | |
|---|---|---|
| 1 | අම්පාර (සිංහල) | 063 – 2223821 / 071 – 1212013 |
| 2 | අම්පාර (දෙමළ) | 067 – 2251155 / 071 – 0318732 |
| 3 | අනුරාධපුර | 025 – 2221400 / 071 – 0318745 |
| 4 | බදුල්ල | 057 – 2223043 / 071 – 7272667 |
| 5 | මඩකලපුව | 065 – 2050753 / 071 – 1783705 |
| 6 | කොළඹ | 011 – 2844151 / 071 – 0318736 |
| 7 | ගාල්ල | 091 – 2234540 / 071 – 0318753 |
| 8 | ගම්පහ | 033 – 2294790 / 071 – 1361130 |
| 9 | හම්බන්තොට | 047 – 2241724 / 071 – 0318721 |
| 10 | යාපනය | 021 – 2227949 / 071 – 0318737 |
| 11 | කළුතර | 034 – 2263698 / 071 – 1040026 |
| 12 | මහනුවර | 081 – 2387200 / 071 – 9660268 |
| 13 | කෑගල්ල | 035 – 2282565 / 071 – 8011109 |
| 14 | කිලිනොච්චිය | 021 – 2285686 / 075 – 8024781 |
| 15 | කුරුණෑගල | 037 – 2237436 / 071 – 1038618 |
| 16 | මාතලේ | 066 – 2286683 / 071 – 0318749 |
| 17 | මාතර | 041 – 2235950 / 071 – 0318743 |
| 18 | මොනරාගල | 055 – 2274775 / 071 – 0318731 |
| 19 | මුලතිවු | 021 – 2290097 / 071 – 3956503 |
| 20 | නුවරඑළිය | 052 – 2223216 / 071 – 1213423 |
| 21 | පොළොන්නරුව | 027 – 2245442 / 071 – 1314779 |
| 22 | පුත්තලම | 032 – 2254110 / 071 – 0318747 |
| 23 | රත්නපුර | 045 – 2274699 / 071 – 0318714 |
| 24 | ත්‍රිකුණාමලය | 026 – 2234517 / 071 – 1211536 |
| 25 | වවුනියාව | 024 – 2221617 / 071 – 1212253 |
| 26 | මන්නාරම | 024 – 2221617 / 071 – 1212253 |
| ජාතික වෘත්තිය පුහුණු ආයතන | | |
| 1 | නාරාහේන්පිට | 011 – 2592233 / 071 – 5145255 |
| 2 | රත්මලාන | 011 – 2638850 / 071 – 9476681 |
| 3 | බද්දේගම | 091 – 2293119 / 071 – 0318744 |

| ජාතික වෘත්තිය පුහුණු ආයතන | | |
|---|---|---|
| 4 | නියාගම | 091 – 2296445 / 071 – 0796902 |
| 5 | මිරිජ්ජවිල | 047 – 2220501 / 071 – 0318748 |
| 6 | තලල්ල | 041 – 2259331 / 071 – 1213609 |
| 7 | මඩකලපුව | 065 – 2240159 / 071 – 0318729 |
| 8 | ඔරුගොඩවත්ත | 011 - 2072850 / 071 - 1315005 |

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබාගැනීමේ අවස්ථාව
- තෝරාගත් පාඨමාලා සඳහා මාසික දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තිය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහතිකයක්
- මාසික දීමනාවක් සමඟින් වැඩිදුර පුහුණුව
- දේශීය / විදේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ අඩු පොළී ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මඟින් දැනුම යාවත්කාලීන කිරීම
- පාඨමාලා කාලය තුළ නොමිලේ ජීවිත රක්ෂණ ආවරණයක්.

**ආදර්ශ අයදුම් පත්‍රය**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

**2026 පළමු අර්ධ වර්ෂය (ජනවාරි කණ්ඩායම) සඳහා ආධුනිකයන් බඳවා ගැනීම**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම - ..........................................................................................................
2. ලිපිනය - ...........................................................................................
3. පදිංචිය - ...........................................................................................
   i. ග්‍රාමසේවා වසම - ............................................................................
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - .........................................................
   iii. දිස්ත්‍රික්කය - ...........................................................................................
4. දුරකතන අංකය - ...........................................................................................
5. උපන් දිනය - .......................................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය - .......................................................................
7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම - ...............................................................................

8. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| පාඨමාලා කේතය (Course Code) | පාඨමාලාව | NVQ මට්ටම | අදාළ මධ්‍යස්ථානය |
|---|---|---|---|
| | 1. | | 1. |
| | 2. | | 2. |
| | 3. | | 3. |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

දිනය - ....................................

....................................
අයදුම්කරුගේ අත්සන

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ ආසන්නතම මධ්‍යස්ථානය වෙත ගොස් භාර දිය හැක. පාඨමාලා ආරම්භය 2026 ජනවාරි මස 05 දින වේ.

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**
**ආධුනිකයන් බඳවා ගැනීම - 2026 පළමු අර්ධ වර්ෂය (ජනවාරි කණ්ඩායම)**

| අ. අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| | | **Automobile Repair & Maintenance**<br>මෝටර්රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | | |
| **01** | | National Certificate - Heavy Vhicle Operator (Fork Lift) | 6 | |
| 02 | AEM 3<br>AEM 4 | National Certificate - Agricultural Machinery & Equipment Mechanic<br>කෘෂිකර්ම යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | 18 |
| 03 | AAM 3 | National Certificate - Automobile Air Conditioning Mechanic<br>මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 04 | AAT 4 | National Certificate - Automobile Air Conditioning Technician<br>මෝටර් රථ වායු සමීකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 05 | AE 3<br>AE 4 | National Certificate - Automobile Electrician<br>මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 06 | AM 4 | National Certificate - Automobile Mechanic<br>මෝටර් රථ කාර්මික ශිල්පි - ජාතික සහතිකය | | 12 / 18 |
| 07 | AP 4 | National Certificate - Automobile Painter<br>මෝටර් රථ පින්තාරු ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 08 | AT 4 | National Certificate - Automobile Technician<br>මෝටර් රථ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 18 |
| 09 | ATi 3<br>ATi 4 | National Certificate - Automobile Tinker<br>මෝටර් රථ වැද්දුම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 6 |
| 10 | MCM 3 | National Certificate - Motorcycle Mechanic<br>යතුරු පැදි කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6 | |
| 11 | | National Certificate - Motorcycle Technician<br>යතුරු පැදි තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| | | **Building & Construction**<br>**ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 12 | ALN 3<br>AL 4 | National Certificate - Aluminium Fabricator<br>ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පි - ජාතික සහතිකය | 6 | 6 |
| 13 | ALFID 4 | National Certificate - Aluminium Fabrication with Interior Decoration<br>ඇලුමිනියම් පිරිසැකසුම් සහ අභ්‍යන්තර අලංකරන ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 14 | CCM 3<br>CCM 4 | National Certificate - Construction Craftsman (Masonry)<br>ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) - ජාතික සහතිකය | 6 | 12 |
| 15 | DP 4 | National Certificate – Draughtsperson<br>සැලසුම් ශිල්පි - ජාතික සහතිකය | | 12 |
| 16 | LT 4 | National Certificate - Landscaping Technician<br>උද්‍යාන අලංකරන තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | | 6 |
| 17 | LDA 3 | National Certificate - Landscaping Development Assistant<br>උද්‍යාන සංවර්ධන සහකාර - ජාතික සහතිකය | 6 | |
| 18 | PL 3<br>PL 4 | National Certificate – Plumber<br>ජලනල කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6 | 12 |
| 19 | QS 4 | National Certificate - Quantity Surveying Assistant<br>සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | | 6 |

| අ අ. | පාඨමාලා කේතය *(Course Code)* | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | *NVQ Level 3* | *NVQ Level 4* |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| | | Electrical, Electronic & Telecommunication<br>විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ | | |
| 20 | MW 3 | National Certificate - Electric Motor Winder<br>විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 21 | | National Certificate - Electric Mechanic Winder | | 6 |
| 22 | EAMT 4 | National Certificate - Electrical Appliance Maintenance Technician<br>විදුලි උපකරණ නඩත්තු තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 23 | EL 3<br>EL 4 | National Certificate – Electrician<br>විදුලි ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 24 | EAT 4 | National Certificate - Electronic Appliances Technician<br>විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 25 | MPR 3 | National Certificate - Mobile Phone Repairer<br>ජංගම දුරකතන අලුත්වැඩියා කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 26 | SPST 4 | National Certificate - Solar Photovoltaic Systems Technician<br>සූර්යබල පද්ධති තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| | | **Food Technology**<br>**ආහාර තාක්ෂණය** | | |
| 27 | BAK 4 | National Certificate - Baker/ Commis I (Pastry & Bakery)<br>බේකරි ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| | | **Gem & Jewellery**<br>**මැණික් හා ස්වර්ණාභරණ** | | |
| 28 | JM 4 | National Certificate - Jewellery Maker (Goldsmith)<br>ස්වර්ණාභරණ (අත් නිමැවුම්) - ජාතික සහතිකය | | 12 |
| 29 | JSS 3 | National Certificate - Jewellery Stone Setter<br>ස්වර්ණාභරණ ගල් ඇල්ලීමේ ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| | | **Hotel & Tourism**<br>**හෝටල් සහ සංචාරක** | | |
| 30 | B 3 | National Certificate – Barista | 6 | |
| 31 | FBA 4 | National Certificate - Food & Beverage Associate<br>ආහාර පාන සහයක ශිල්පී - ජාතික සහතිකය | | 6 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 32 | GRO 4 | National Certificate - Guest Relation Officer<br>ආගන්තුක සම්බන්ධතා නිලධාරි - ජාතික සහතිකය | | 6 |
| 33 | PC 4 | National Certificate - Professional Cookery<br>වෘත්තිය සූපවේදි - ජාතික සහතිකය | | 6 |
| 34 | QSR 4 | National Certificate – Quick Service Restaurant (QSR) Crew Member<br>ඉක්මන්සේවා ආපනශාලා කාර්යය මණ්ඩල සාමාජික - ජාතික සහතිකය | | 4 |
| 35 | RA 3 | National Certificate – House Keeping Services<br>කාමර සේවක සේවා ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| | | **Information Communication & Multimedia Technology**<br>**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය** | | |
| 36 | APCGD 4 | Adobe Certified Professional / Graphic Designer | | 6 |
| 37 | CGD 4 | National Certificate - Graphic Designer<br>චිත්‍රක ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 38 | CHDHI 4 | National Certificate - Graphic Designer (Hearing Impaired)<br>චිත්‍රක ශිල්පී (ශ්‍රවණාබාධිත) - ජාතික සහතිකය | | 6 |
| 39 | CHT 4 | National Certificate - Computer Hardware Technician<br>පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 40 | CHTCi IT (A+) 4 | National Certificate - Computer Hardware Technician with CISCO IT Essential / A Puls | | 6 |
| 41 | | National Certificate – CISCO CCNA / Network Technician | | 1440Hrs |
| 42 | CHNTCi IT (A+) 4 | National Certificate - Computer Hardware and Network Technician with CISCO IT Essential (A+) | | 12 |
| 43 | ICT 4 | National Certificate - Information and Communication Technology Technician<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 44 | ICT 3 | National Certificate – Computer Application Assistant<br>පරිගණක යෙදවුම් සහායක ශිල්පී - ජාතික සහතිකය | 4 | |
| 45 | MDA 4 | National Certificate - Multimedia Designing Associate<br>බහුමාධ්‍ය නිර්මාණ සහකරු - ජාතික සහතිකය | | 12 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 46 | SD 4 | National Certificate - Software Developer<br>මෘදුකාංග සංවර්ධක - ජාතික සහතිකය | | 12 |
| 47 | WD 4 | National Certificate - Web Developer | | 6 |
| | | **Leather & Footwear**<br>**සම් ආශ්‍රිත නිෂ්පාදන** | | |
| 48 | LPC 3 | National Certificate - Leather Product Craftsman<br>සම්භාණ්ඩ ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| | | **Metal & Light Engineering**<br>**ලෝහ හා ලුහු ඉංජිනේරු** | | |
| 49 | FM 3<br>FM 4 | National Certificate - Fabricator (Metal)<br>ලෝහ පිරිසැකසුම්කරු - ජාතික සහතිකය | 12 | 12 |
| 50 | M-CML 4 | National Certificate - Machanist (CNC Milling & Lathe Operator)<br>යන්ත්‍ර ශිල්පී (CNC Milling & Lathe Operator) - ජාතික සහතිකය | | 6 |
| 51 | M-CM 4 | National Certificate - Machanist (CNC Milling Operator)<br>යන්ත්‍ර ශිල්පී (CNC Milling) - ජාතික සහතිකය | | 6 |
| 52 | M 3<br>M 4 | National Certificate - Machanist<br>යන්ත්‍ර ශිල්පී - ජාතික සහතිකය | 12 | 12 |
| 53 | WE 3<br>WE 4 | National Certificate – Welder<br>පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | 6 | 12 |
| 54 | WE-GATM 4 | National Certificate - Welder (GAS/ARC/TIG/MAG)<br>පෑස්සුම් ශිල්පී (GAS/ARC/TIG/MAG) - ජාතික සහතිකය | | 12 |
| | | **Office Management**<br>**කාර්යාල කළමනාකරණය** | | |
| 55 | SEC 4 | National Certificate - Secretary (Secretarial Practice)<br>ලේකම් පරිචය - - ජාතික සහතිකය | | 12 |
| | | **Personal & Community Development**<br>**පුද්ගල හා සමාජ සංවර්ධනය** | | |
| 56 | CHC 4 | National Certificate - Child Caregiver<br>ළමා සුරැකුම් - ජාතික සහතිකය | | 6 |
| 57 | BC 4 | National Certificate – Beautician<br>රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | | 4 |

| අ අ. | පාඨමාලා කේතය (Course Code) | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | NVQ Level 3 | NVQ Level 4 |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 58 | HD 4 | National Certificate – Hair Dresser<br>කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | | 4 |
| 59 | PST 4 | National Certificate – Preschool Teacher (Early Childhood Development)<br>පෙර පාසල් ගුරු - ජාතික සහතිකය | | 12 |
| | | **Printing & Packaging**<br>**මුද්‍රණ සහ ඇසුරුම්** | | |
| 60 | OLMO 3 | National Certificate - Offset Machine Operator<br>ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6 | |
| | | **Ref & Air-conditioning**<br>**ශීතකරණ හා වායුසමීකරණ** | | |
| 61 | RAM 3 | National Certificate - Refrigeration & Air-conditioning Mechanic<br>ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 12 | |
| 62 | RAT 4 | National Certificate - Refrigeration & Air-conditioning Technician<br>ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| | | **Textile & Garment**<br>**රෙදිපිළි හා ඇඟලුම් ශිල්පී** | | |
| 63 | ADT 4 | National Certificate - Apparel Design Technician<br>ඇඟලුම් නිර්මාණ තාක්ෂණ ශිල්පී - ජාතික සහතිකය | | 12 |
| 64 | BA 3 | National Certificate - Batik Artist<br>බතික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 65 | DMT 3<br>DMT 4 | National Certificate - Dress Maker / Tailor<br>ඇඳුම් මැසීම - ජාතික සහතිකය | 6 | 6 |
| 66 | ISMM 3<br>ISMM 4 | National Certificate - Industrial Sewing Machine Mechanic<br>අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පී - ජාතික සහතිකය | 6 | 6 |
| 67 | ISMO 3 | National Certificate - Industrial Sewing Machine Operator<br>අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 4 | |
| 68 | PM 4 | National Certificate - Pattern Maker<br>මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | | 6 |
| 69 | PSS 4 | National Certificate - Production Supervisor (Sewing)<br>නිෂ්පාදන සුපරීක්ෂක (මැහුම්) - ජාතික සහතිකය | | 6 |

| අ. අ. | පාඨමාලා කේතය *(Course Code)* | වෘත්තිය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | *NVQ Level 3* | *NVQ Level 4* |
|---|---|---|---|---|
| | | | පාඨමාලා කාලය (මාස) | |
| 70 | QAS 4 | National Certificate - Quality Assurance Supervisor (Apparel Production)<br>තත්ත්ව සහතික සුපරීක්ෂක (ඇඟළුම් නිෂ්පාදනය) - ජාතික සහතිකය | | 6 |
| 71 | SCR 3 | National Certificate - Screen Printer<br>තිර මුද්‍රණකරු - ජාතික සහතිකය | 6 | |
| 72 | TG 3<br>TG 4 | National Certificate - Tailor (Gents)<br>ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 6 | 6 |
| 73 | IEO 4 | National Certificate - Industrial Engineering Officer (Work-Study) | | 6 |
| | | **Wood Related**<br>දැව ආශ්‍රිත | | |
| 74 | WCA 3 | National Certificate - Wood Carving Artist<br>ලී කැටයම් ශිල්පී - ජාතික සහතිකය | 6 | |
| 75 | WCB 3 | National Certificate - Wood Craftsman (Building)<br>දැව තාක්ෂණ ශිල්පී (ගොඩනැගිලි) - ජාතික සහතිකය | 6 | |
| 76 | WCBAL 3<br>WCBAL 4 | National Certificate - Wood Craftsman (Building) with relevant Aluminum Modules | 6 | 12 |
| 77 | WCF 3<br>WCF 4 | National Certificate - Wood Craftsman (Furniture)<br>දැව තාක්ෂණ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 6 | 12 |
| 78 | WCFAL 3<br>WCFAL 4 | National Certificate - Wood Craftsman (Furniture) with relevant Aluminum Modules | 6 | 12 |
| | | **Course Name** | **NVQ Level 5** | |
| 79 | COSM 5 | National Diploma - Cosmetology | 840Hrs | |
| 80 | QS 5 | National Diploma - Quantity Surveying<br>ප්‍රමාණ සමීක්ෂක - ජාතික ඩිප්ලෝමාව | 12 | |
| 81 | ICT 5 | National Diploma -Information and Communication Technology NVQ Level 05<br>තොරතුරු හා සංනිවේදන තාක්ෂණය - ජාතික ඩිප්ලෝමාව | 12 | |

සංශෝධනය යි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,465 හා 2025 නොවැම්බර් මස 28 දින දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලද, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාග පරීක්ෂණය 2025 සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය පහත දැක්වෙන ඡේදයේ සඳහන් කොටස ඉවත් කරනු ලැබේ.

ඉවත් කරන ලද කොටස :
සම්පූර්ණ විභාග ගාස්තුව රු. 500/-කි.

මෙම සංශෝධනය හැර ඉහත *ගැසට් පත්‍රය* මගින් දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි නොවෙනස්ව පවතී.

**එස්. එච්. ඒ. එන්. නෙළුම්මලී,**
සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ)
ලේකම් *වෙනුවට.*

12 - 241

---

සංශෝධනයයි

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025**

අංක 2,463 දරන හා 2025 නොවැම්බර් මස 14 දිනැති *ගැසට් පත්‍රය* මගින් පළකරන ලද "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සීමිත තරග විභාගය - 2025" යන නිවේදනයේ 2.1 ඡේදයෙහි සඳහන් අයදුම්පත් භාර ගැනීම **2026 ජනවාරි මස 02 දින ප. ව. 9.00 දක්වා** දීර්ඝ කරනු ලැබේ. තව ද එම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය හා අනෙකුත් සියලුම කරුණු එලෙසම නොවෙනස්ව පවතී.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 08 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශයේ දී ය.

12 - 274

---

සංශෝධනයයි

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2025 (2026)**

අංක 2,464 දරන හා 2025 නොවැම්බර් මස 21 දිනැති *ගැසට් පත්‍රය* මගින් පළකරන ලද "ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2025 (2026)" යන නිවේදනයේ පළමු ඡේදයෙහි සහ 07 ඡේදයෙහි සඳහන් අයදුම්පත් භාර ගැනීම 2026 **ජනවාරි මස 09 දින ප. ව. 9.00 දක්වා** දීර්ඝ කරනු ලැබේ. තව ද එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම නොවෙනස්ව පවතී.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 08 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන
අමාත්‍යාංශයේ දී ය.

12 - 275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.